**ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය - 2023**
**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් **විගණන** වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ ප්‍රමිතියේ 76-87 ඡේදවලට අනුකූලව ජංගම හා ජංගම නොවන වත්කම් වර්ග කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුහුණතෙහි වෙනම දැක්විය යුතු වුවත් ආයතනයේ රු.51,953,115ක් වූ ලැබිය යුතු ආපදා ණය ලැබිය යුතු කාල සීමාව මත ජංගම නොවන වත්කම් ලෙස දැක්වීම වෙනුවට එම ණය ශේෂය ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | 2024 වර්ෂයේ දී මූල්‍ය ප්‍රකාශන තුළ ආපදා ණය ජංගම හා ජංගම නොවන වත්කම් ලෙස වෙන් කිරීමට කටයුතු කරමි. | ගිණුම් ප්‍රමිතිය ප්‍රකාරව ජංගම වත්කම් හා ජංගම නොවන වත්කම් ලෙස වෙන් කර දැක්විය යුතු වේ. |
| (ආ) | සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද රු.55,628,433ක් වටිනා වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ආයතනය සතුව දැනට ශුද්ධ ශූන්‍ය අගයක් සහිත වත්කම් රු.55,628,433.00ක වටිනාකමක් මූල්‍ය ප්‍රකාශන වල දේපළ පිරියත හා උපකරණ යටතේ පවතී. ඉදිරියේදී මෙම වත්කම් සියල්ල ගිණුම්කරණ ප්‍රමිත අංක 07ට අනුව ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශන වලට ගැනීමට බලාපොරොත්තු වේ. | ගිණුම් ප්‍රමිතිය ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | කල්බදු ගිවිසුම් යටතේ ගොඩනැගිලි 2ක් වසර 3ක් සඳහා හා ගොඩනැගිලි 2ක් වසර 5ක් සඳහා ලබා ගෙන තිබුණි. නමුත් ඒ සඳහා ගෙවා තිබූ රු.4,627,108ක අලුත්වැඩියා වියදම් | අනුරාධපුර, කළුතර, මාතර, ත්‍රිකුණාමලය වන ශාඛා කල්බදු කාලය සැළකිල්ලට ගනිමින් එම අදාළ වසර වල අඩු කරන ක්ෂය වූ මුදල වන රු.929,351 ක මුදල 2024 | ගිණුම් ප්‍රමිතිය ප්‍රකාරව කල්බදු දේපළ ගිණුම් තැබීම සම්බන්ධයෙන් |

| | | |
|---|---|---|
| ප්‍රාග්ධනිත කර තිබූ අතර එම ප්‍රාග්ධනිත කරන ලද වියදම් ගොඩනැගිලිවල කල්බදු කාල සීමාව තුළ ලියා හැරීමට කටයුතු නොකර වසර 40ක කාලයක් ගෙන තිබීම නිසා සමාලෝචිත වර්ෂය තුළ රු.929,351ක් අඩුවෙන් ක්ෂය ගලපා තිබූ අතර ඒ හේතුවෙන් ලාභය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනයේ සමුච්චිත ලාභයට ගැළපීමට කටයුතු කරමි. | කටයුතු කළ යුතු වේ. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාවර තැන්පතු පොළී සඳහා බැංකුව විසින් අයකරන ලද රඳවා ගැනීමේ බදු රු.8,740,974 ක් ලැබිය යුතු රඳවා ගැනීමේ බදු ගිණුම හර කර ස්ථාවර තැන්පතු පොළී ගිණුම බැර කළ යුතු වුවත්, ආයතනයේ ස්ථාවර තැන්පතු පොළී ගිණුම හර කර, රඳවා ගැනීමේ බදු ගිණුම බැර කර තිබුණි. ඒ අනුව පොළී ආදායම හා පොළී මත රඳවා ගැනීමේ බදු එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | රඳවා ගැනීමේ බදු (withholding tax) ගිණුම්ගත කිරීමේදී මෙම දෝෂය සිදු වී ඇති අතර වර්ෂයේ ආදායම රු.8,740,974 ක ප්‍රමාණයකින් අඩු වී ඇති නිසා , සහ 2024 වර්ෂයේ සමුච්චිත ලාභයට ගැළපීම් සිදුකිරීමට කටයුතු කරමි. | පොළී මත රඳවා ගැනීමේ බදු මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතු වේ. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දින වන විට ලැබිය යුතු රු.14,233,512ක ශේෂයන් වසර 2 සිට 5 දක්වා අය නොවී පවතින ශේෂය රු.2,348,821ක් වූ අතර වසර 5ට වැඩි ශේෂය රු.10,546,421ක් වුවත් අදාළ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය අතර සාකච්ඡාවන් සිදුකරමින් පවතින අතර මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් ඉදිරියේදී තීරණයක් ලබා ගනු ඇත. | ලැබිය යුතු මුදල් නියමිත පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1997 අංක 25 දරණ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනත 3(ආ) වගන්තිය | පනතේ දක්වා ඇති කර්තව්‍යය අනුව බර වාහන ඇතුළු සියළු වර්ගවල මෝටර් රථ වාහන වල රියදුරන් හා ධාවකයින් පරීක්ෂා කර ඒ රියදුරන් හා ධාවකයන්ට ශාරීරික හා මානසික යෝග්‍යතාවය පිළිබඳ සහතික ලබා දීම සිදුකරනු ලැබුව ද රුධිර සීනි මට්ටම ට වැඩි 200 සේවාලාභීන් වෛද්‍ය පරීක්ෂාවෙන් සමත් කර තිබුණු අතර පද්ධති වෛද්‍ය පරීක්ෂණ වාර්තාවේ සේවාදායකයින්ගේ දෘශ්‍ය මට්ටම සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි. | සේවාලාභීන්ගේ වෛද්‍ය පරීක්ෂණ සිදුකිරීම සඳහා අවශ්‍ය වන ප්‍රමිතීන් හා වෛද්‍ය නිර්ණායක ආරම්භයේ සිටම හඳුනාගෙන ඇති අතර මේ දක්වා ප්‍රමිතීන් හා නිර්ණායකයන් ශ්‍රී ලංකාව තුල ඒ ඒ විෂය ක්ෂේත්‍රයට අදාලව පිහිටා ඇති විශේෂඥ වෛද්‍ය විද්‍යාලවල නිර්දේශ සහිතව යාවත්කාලීන කිරීමට කටයුතු කරමි. | ප්‍රමිතීන් හා නිර්ණායක යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| i. | ii වන පරිච්ඡේදයේ 10 වන වගන්තිය | තනතුරකට බඳවා ගනු ලබන නිළධාරියෙකු සෞඛ්‍ය 169 ප්‍රකාරව වෛද්‍ය පරීක්ෂණයට ඉදිරිපත් විය යුතු වුවත්, ආයතනයේ නිළධාරීන් සඳහා එම වාර්තාව ලබා නොගෙන මෝටර් වාහන බලපත්‍රය ලබා ගැනීමට යෝජිත වෛද්‍ය සහතිකය ලබා දී තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 2021/67 මගින් ද රජයේ හා සංස්ථාවල භාවිතා වන ආකාරයේ වෛද්‍ය පෝරමයක් | මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යොමු කර අනුමැතිය හිමි වුවද නව වෛද්‍ය පෝරම භාවිතයට ගැනීම සම්බන්ධයෙන් හිටපු සභාපතිතුමාගේ අනුමැතිය හිමි නොවීය. නමුත් මේ පිළිබඳව නැවත සාකච්ඡා කර වෛද්‍ය සහතිකය පිළිබඳව ඉදිරියේදී තීරණයක් ගැනීමට කටයුතු කරනු ලැබේ. | අදාළ වගන්තිය පරිදි වෛද්‍ය වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | යොදා ගන්නා ලෙස අනුමැති ලබා දී තිබුණ ද, ඒ අනුව ද කටයුතු කර නොතිබුණි. | | |
| ii. | vi වන පරිච්ඡේදයේ 2.1 වගන්තිය අනුව | ස්ථිර වශයෙන් පරිවාසයට යටත් කොට හෝ ගිවිසුමක් පිට හෝ යම් නිලධාරියෙකු තනතුරකට පත් කෙරෙන විට ඒ නිළධාරියා වෙනුවෙන් චර්යා සටහන් පත්‍රයක් වහාම පිළියෙල කළ යුතු වුව ද ආයතනයේ පරීක්ෂා කරන ලද පුද්ගලික ලිපිගොනු 6 ක චර්යා සටහන් ඇතුළත් කර නොතිබුණි. | අප ආයතනය සඳහා උචිත ආකාරයේ චර්යා සටහන් පත්‍රයක් සකස් කර ඉදිරියේදී ලිපිගොනු සඳහා ඇතුළත් කිරීමට උපදෙස් ලබා දී ඇත. | අදාළ වගන්තිය පරිදි චර්යා සටහන් පත් අමුණා පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| | 5.4.10වගන්තිය | මෙම වගන්තිය ප්‍රකාරව යම් කොන්ත්‍රාත්තුවක කොන්ත්‍රාත්කරු විසින් ගිවිසුම උල්ලංඝනය කළහොත් ප්‍රසම්පාදන අස්ථිත්වය ආරක්ෂා කිරීම සඳහා ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් මුදලින් සියයට පහකට නොඅඩු මුදලක් කාර්ය සාධන සුරක්ෂණයක් වශයෙන් ලබා ගත යුතු වුවත් 2022/2023 වර්ෂය සඳහා ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් කාර්ය සාධන සුරක්ෂණයක් ලබා ගෙන නොතිබුණි. | 2020/2021 වර්ෂය සඳහා පමණක් කාර්ය සාධන සුරක්ෂණයක් ලබා ගෙන ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.957,640,668ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.422,911,482 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.534,729,186 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ප්‍රධාන වෛද්‍ය සේවා ආදායම රු.418,584,701 කින් ඉහළයාම මෙම වර්ධනයට හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ දී ඉකුත් වර්ෂයට සාපේක්ෂව වෛද්‍ය ආයතනයේ ප්‍රධාන ආදායම් තුළ ඇතුළත් සැහැල්ලු වාහන පරීක්ෂා කිරීමේ/අලුත්කිරීමේ ආදායම් සියයට 68කින්ද බර වාහන පරීක්ෂා කිරීමේ ආදායම් සියයට 102කින් හා බර වාහන අළුත්කිරීමේ ආදායම් සියයට 42කින් වැඩි වී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය 0.31ක් වන අතර, ඉකුත් වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය 4.08ක් ලෙස පැවතුණි. සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 700ක මුදලක් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම හේතුවෙන් වර්ෂයේ ජංගම අනුපාතය අඩුවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ ලාභ අනුපාතය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 57කින් වැඩි වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නුගේගොඩ ප්‍රධාන කාර්යාලයේ රියදුරු හා ආරක්ෂක විවේකාගාර ගොඩනැගිල්ලේ පළමු මහළ දින 180කින් ඉදිකිරීමට 2022 පෙබරවාරි 09 දින පෞද්ගලික සමාගමක් සමඟ වැට් බදු සහිතව රු.6,629,903ක වටිනාකමට ගිවිසුමකට එළඹී තිබුණි. කොන්ත්‍රාත්කරු වෙත 2024 වර්ෂය වන විට රු.7,309,432 ක් ගෙවා තිබුණ ද, ඉදිකිරීම් කටයුතු නිම කර නොතිබුණි. | කළමනාකරණය මේ සම්බන්ධයෙන් අවස්ථා රාශියකදී කටයුතු කරන ලද අතර, අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා කිහිපයක්ම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරන ලදී. එසේම අප රාජකාරි කළයුත්තේ වර්තමානයේ රජය විසින් වරින් වර නිකුත් කරන රාජ්‍ය වියදම කළමනාකරණය චක්‍රලේඛ වලට අනුව වේ. ඉහත කරුණු හේතුවෙන් 2023 වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම අනුව මෙම කාර්යය නිම කර ගැනීමට නොහැකි වී ඇත. | කොන්ත්‍රාත් ගිවිසුම් හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ පරිදි කටයුතු කළ යුතු වේ. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයට වෛද්‍යවරුන්, පරිපාලන නිලධාරීන්, දත්ත විශ්ලේෂකයන් බඳවා ගැනීමට අදාළ බඳවා ගැනීමේ පටිපාටිය සඳහා අනුමැතිය ලැබී නොතිබීම හේතුවෙන් ආයතනයට අවශ්‍ය වෛද්‍යවරුන් 67 දෙනෙකුද, පරිපාලන නිලධාරීන් 17 දෙනෙකුද බඳවා ගැනීමට නොහැකි වී තිබුණි. | ආයතනය තුළ ස්ථිර වෛද්‍ය නිලධාරීන් සිටිනුයේ සුළු ප්‍රමාණයකි. ස්ථිර වෛද්‍ය නිලධාරීන් බඳවා ගැනීමට දීර්ඝ කාලයක සිට පුවත්පත් දැන්වීම් පළකරමින් උත්සාහ කළද, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ වැටුප් හා දීමනා මත අපගේ ආයතනයෙන් වෛද්‍ය නිලධාරීන්ට ගෙවනු ලබන දීමනා අඩු බැවින් ස්ථිර පදනම මත වෛද්‍ය නිලධාරීන් ආයතනයේ සේවයට පැමිණීමට අකමැත්තක් දක්වයි. එබැවින් කොන්ත්‍රාත් පදනම මත හා දෛනික පැය පදනම මත වෛද්‍ය නිලධාරීන් බඳවා ගෙන සේවාලාභීන් අපහසුතාවයට පත් නොවන පරිදි සේවය අඛණ්ඩව පවත්වා ගෙන යනු ලබයි.<br>පරිපාලන නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. | අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු වේ. |